**2024-07-29 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ**

01. **ඉන්දියානු රජයේ ආධාර යටතේ වතු පාසල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම**

ඉන්දීය රජයේ රුපියල් මිලියන 300ක ප්‍රදානයක් මගින් වතු පාසල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම පිණිස 2019-06-04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇති අතර, ශ්‍රී ලංකාවේ පැවති ආර්ථික අර්බුදය මත මිල ගණන් ඉහළ යාම හේතුවෙන් එකී ව්‍යාපෘතිය සඳහා වන මුළු ප්‍රදානය රුපියල් මිලියන 600 දක්වා වැඩි කිරීමට ඉන්දීය රජය විසින් එකඟතාව පළ කර ඇත. ඒ අනුව, එකී ප්‍රදානය ලබා ගැනීම සඳහා අදාළ ලේඛනවලට අත්සන් තැබීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

02. **කැලණිය විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම**

කැලණිය විද්‍යාලංකාර පිරිවෙන පරිශ්‍රයේ ඉදිකරමින් පවතින ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව පසුගිය කාලයේ ඊට බලපෑ බාහිර හේතූන් මත සම්පූර්ණ වශයෙන් නිම කර ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමට නොහැකි වී ඇත. එබැවින්, එකී සම්මන්ත්‍රණ ශාලා ගොඩනැගිල්ල ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම සඳහා සිදු කළ යුතුව ඇති අත්‍යවශ්‍ය ඉදිකිරීම් සිදු කිරීම පිණිස අවශ්‍ය ප්‍රතිපාදන 2025 වර්ෂයේදී සලසා ගැනීම පිණිස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **සීදූව ප්‍රදේශයේ ඉදිකරනු ලබන ජාතික සමාජ සංවර්ධන ආයතනයට අයත් ගොඩනැගිලි සංකීර්ණය**

රුපියල් මිලියන 1,000ක මූලික පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ සීදූව ප්‍රදේශයේ ජාතික සමාජ සංවර්ධන ආයතනයට අයත් ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2016-07-26 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය

ලබා දී ඇත. ඒ අනුව, එම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පිරිනමා ඇති අතර ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂයේදී අවසන් කර භාර දීමට නියමිතව තිබුණි. එහෙත්, 2019 සිට 2023 දක්වා රටේ පැවති අර්බුදකාරී තත්ත්වයන් මත අදාළ කොන්ත්‍රාත්තුවේ කාලසීමාව දීර්ඝ කර ඇත. මෙම කාලය තුළ සිදු වූ භාණ්ඩවල මිල ඉහළ යෑම හේතුවෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිකිරීම් පිරිවැයට අදාළව මිල විචලනයක් ඉල්ලා තිබේ. ඒ අනුව, තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත අදාළ මිල උච්චාවචන වටිනාකම වන රුපියල් මිලියන 63.68ක මුදල ගෙවීම පිණිස කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**04. කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි තේ අලෙවි කිරීමේ සාප්පු පවත්වාගෙන යෑම සඳහා වන ප්‍රසම්පාදනය**

කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි මෙරටින් පිටත්වීමේ ගුවන්යානා පැමිණෙන තෙක් මගීන් රැඳී සිටින ප්‍රදේශයේ තේ අලෙවි කිරීමේ සාප්පු 05ක් දැනට ක්‍රියාත්මක වේ. එකී සාප්පු පවත්වාගෙන යෑම සඳහා ජාතික තරඟකාරී ලංසු ක්‍රියාවලිය යටතේ ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසුකරුවන් 08දෙනෙකු විසින් ලංසු ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි පහත සඳහන් සමාගම් වෙත අදාළ කොන්ත්‍රාත්තු පිරිනැමීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* Euro - Scan Exports (Pvt) Limited
* English Tea Shop (UK) Limited
* Sunshine Consumer Lanka Limited
* U H E Exports (Pvt) Limited
* Ceylon Royal Teas (Pvt) Limited

05. **නන් අයනික් කන්ට්‍රාස්ට් මීඩියා (Non Ionic Contrast Media) සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනය**

CT සහ X කිරණ රූපකරන ක්‍රම සඳහා භාවිත කරන Non Ionic Contrast Media මිල දී ගැනීම සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු ක්‍රමවේදය යටතේ ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 06ක් ලැබී තිබේ. ඒ අනුව, තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි සාරානුකූල ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන යුනික් ෆාමර්සූටිකල්ස් ලැබෝටරීස් වෙත අදාළ ප්‍රසම්පාදනය පිරිනැමීම පිණිස සෞඛ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **ටැන් (TAN) ඉම්ප්ලාන්ට්ස් සහිත ඩිස්ටල් ෆිමෝරල් නේලින් කට්ටල 45ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

දරුණු අස්ථි බිඳීම්වලදී අස්ථි සුව කිරීම හා පෙළගැස්වීම ප්‍රවර්ධනය කිරීම සඳහා සිදු කරනු ලබන විකලාංග සැත්කම්වලදී භාවිත කරන ටැන් (TAN) ඉම්ප්ලාන්ට්ස් සහිත ඩිස්ටල් ෆිමෝරල් නේලින් කට්ටල 45ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 02ක් ලැබී තිබේ. ඒ අනුව, තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද අවම ලංසුකරු වන ඉන්දියාවේ M/s Medisurg International., වෙත අදාළ ප්‍රසම්පාදනය පිරිනැමීම පිණිස සෞඛ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **(393 වන අධිකාරය වූ) 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි විධිවිධාන අනුව පත් කරන ලද කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

මානව හිමිකම් උල්ලංඝණය වීම් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පූර්වගාමීව පත් කරන ලද කොමිෂන් සභා සහ කමිටු මඟින් ඉදිරිපත් කරනු ලැබ ඇති විමර්ශන වාර්තා පරීක්ෂා කර බලා පවත්නා නීතිය ප්‍රකාරව මෙතෙක් කටයුතු කර ඇති ආකාරය හා වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව තවදුරටත් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස ගත යුතු පියවරයන් සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා (393 වන අධිකාරය වූ) 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි 2 වන වගන්තියේ විධිවිධාන අනුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු

ඒ.එච්.එම්.ඩී.නවාස් මහතාගේ ප්‍රධානත්වයෙන් පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කරනු ලැබ තිබේ. එම කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**08. 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා සනත සංශෝධනය කිරීම**

1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම පිණිස 2022-09-22 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව නීති කෙටුම්පත් සම්පාදක විසින් පනත් කෙටුම්පතක් සකස් කර ඇති අතර, ඒ සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව, අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**09. ශ්‍රී ලංකාවේ සත්‍යය, සමඟිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාව පනත් කෙටුම්පත**

නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කරන ලද ශ්‍රී ලංකාවේ සත්‍යය, සමඟිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාව පනත් කෙටුම්පත සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු සැලකිල්ලට ගෙන, එකී පනත් කෙටුම්පත සංශෝධනය කරමින් නව පනත් කෙටුම්පතක් සකස් කිරීම පිණිස 2024-07-15 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව, අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත සංශෝධනය කිරීම**

කොළඹ වරාය නගරයේ ව්‍යාපාරවල යෙදීමට බලාපොරොත්තු වන ආයෝජකයින් විසින් පෙන්වා දී ඇති ව්‍යාපාර මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා පවතින බාධාවන් ඉවත් කරමින්, ගෝලීය වශයෙන් තරඟකාරී විශේෂිත ආර්ථික කලාපයක් ලෙස කොළඹ වරාය නගරයේ ශක්‍යතාව ඉහළ නැංවීමට හැකි වන පරිදි කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන තිබේ. ඒ අනුව අදාළ සංශෝධන ඇතුළත් කරමින් 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් දීම පිණිස ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **ශ්‍රී ලංකා ක්‍රිකට් සඳහා වන නව ව්‍යවස්ථාව නීතිගත කිරීම**

ශ්‍රී ලංකා ක්‍රිකට් මුහුණ දෙන ගැටලු පිළිබඳව කරුණු අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා විදේශ කටයුතු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද අමාත්‍ය මණ්ඩල අනුකමිටුවේ වාර්තාවේ නිර්දේශයන්ට අනුකූල වන පරිදි ශ්‍රී ලංකා ක්‍රිකට් සඳහා නව ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම පිණිස විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු කේ.ටී. චිත්‍රසිරි මහතාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කිරීමට 2024-02-19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව එම කමිටුව විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් සඳහා වන නව ව්‍යවස්ථාව කෙටුම්පත් කරනු ලැබ තිබේ. යෝජිත ශ්‍රී ලංකා ක්‍රිකට් ව්‍යවස්ථාව විධිමත් පරිදි සම්මත කර ක්‍රියාත්මක කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස විදේශ කටයුතු අමාත්‍යතුමා, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා සහ මහජන ආරක්ෂක අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **දේශීය වෙළෙඳපොළේ බිත්තර මිල ස්ථායීකරණය සඳහා බිත්තර ආනයනය කිරීම**

2024-03-18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් මේ වන විට බිත්තර මිලියන 224ක් ආනයනය කර ඇත. ඉන් 95%ක ප්‍රමාණයක් ලංකා සතොස අලෙවි ජාලය හරහා බිත්තරයක් රුපියල් 37/-ක දැරිය හැකි මිලකට පාරිභෝගික ජනතාව වෙත බෙදා හැර ඇති අතර, බිත්තර ආනයනය කිරීමට ලබා දී ඇති කාලසීමාව 2024-04-30 දිනෙන් අවසන් වී තිබේ. ඒ අනුව, එළඹෙන රාමසාන් සහ නත්තල් උත්සව කාලසීමාවන් තුළ ද වෙළෙඳපොළ බිත්තර මිල ස්ථායීකරණය කිරීමට සහ කේක් ඇතුළු බේකරි නිෂ්පාදන කර්මාන්තයට අවශ්‍ය බිත්තර සැපයීමට හැකි වනු පිණිස අවශ්‍ය බිත්තර තොග ආනයනය කිරීම සඳහා වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩල විසින් අනුමත කරන ලදී.

13. **රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්ව ජාතික නියෝජිතායතනය සඳහා නව පනතක් හඳුන්වා දීම**

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්ව ජාතික නියෝජිතායතනය විසින් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්ව වැඩසටහන්/ව්‍යාපෘති නිර්මාණය හා කළමනාකරණය කිරීම සම්බන්ධව ජාත්‍යන්තර ආයතන සමඟ ඒකාබද්ධව කටයුතු කිරීමටත් එවැනි වැඩසටහන් හඳුනා ගනිමින් රාජ්‍ය ආයතන සමඟ සහයෝගීව එකී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් අපේක්ෂා කරනු ලබයි. එම නියෝජිතායතනය වඩාත් ඵලදායීව පවත්වාගෙන යාම සඳහා ඊට නෛතිකමය වලංගුභාවයක් ලබා දිය යුතු අතරම, අදාළ හවුල්කාරීත්ව ගිවිසුම් සම්බන්ධයෙන් ද නෛතික රාමුවක් සකස් කළ යුතුව තිබේ. ඒ අනුව එකී කාර්යය සඳහා පනත් කෙටුම්පතක් සකස් කිරීම පිණිස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

***************